මව්බිම දැන් ඉරිදා
2026 ජූලි 05

# හාට්

හදවත් හිරවෙට්ටන් තැන...





රොහාන් විජේතුංග

'බොහිමියානුවා' නාට්‍යයෙන් කලා ලොවට පිවිසි ඔහු, 'කළු කුරුල්ලා', 'මෙඩිසිනා', 'වර්ණ', 'හාර කෝටිය', 'කෝටිපතියෝ', 'සිල්ලර සමනල්ලු', 'ලංසුපතිනියෝ', 'නීල පබළු', 'රොන් සොයා' වැනි ටෙලිනාට්‍ය රැසක විවිධ චරිතයන්ට ජීවය ලබා දුන්නේය. එමෙන්ම 'කොළඹ සන්නිය', 'පහ සමත්', 'ෂෙලීනා' යන චිත්‍රපටවලට මෙන්ම 'සුදු ඇඳගෙන හොරු ඇවිදින්', 'කක්කුට්ටා', 'හොරු නැතුවත් බෑ' වැනි වේදිකා නාට්‍ය නිර්මාණ රැසකට ද සිය දායකත්වය ලබාදෙමින් ප්‍රේක්ෂක සිත් දිනාගැනීමට සමත් විය. විශේෂයෙන්ම 'හාරකෝටිය' ටෙලිනාට්‍යයේ 'කානු ගෙදර රංජි' චරිතය හරහා පුළුල් ප්‍රේක්ෂක ආදරයක් සහ ජනප්‍රියත්වයක් දිනාගත් ඔහු, වේදිකාව, ටෙලිනාට්‍ය සහ සිනමාව යන ක්ෂේත්‍ර ත්‍රිත්වයේම සිය දක්ෂතා විදහා දැක්වූ රංගන ශිල්පියෙකි. ඔහු නමින් රොහාන් විජේතුංගයි.



# සම්මානවල හැඩයවත් මම දන්නේ නැහැ...

## රසිකයන්ගේ ආදරය තරම් වෙන මොන සම්මානද?

**රොහාන්, අපි පාසල් කාලයෙන් කතාව පටන් ගමු?**

මම හිග්ගස්වත්ත කනිෂ්ඨ විද්‍යාලයෙන් ශිෂ්‍යත්ව විභාගය සමත් වෙලා ඇහැලියගොඩ ජාතික පාසලට ඇතුළත් වුණා. මට ඒ කාලයේ ලොකු හීනයක් තිබුණා රූපවාහිනී ප්‍රවෘත්ති නිවේදකයෙක් වෙන්න. ඉස්කෝලේ තිබුණු කලා දිනයක ප්‍රධාන ආරාධිතයා විදිහට ප්‍රවීණ රංගධර තුමිඳු දොඩන්තැන්න සහභාගි වෙනවා. ඒ උත්සවයේදී ඔහු කරන දේශනය නිසා ඇති වූ ලොකු ආසාව නිසා ඔහුගේ ශිෂ්‍යයකු විදිහට නාට්‍ය හා රංග කලාව හදාරන්න උසස් පෙළ සමත්ව කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රසංග කලා අධ්‍යයන අංශයට ඇතුළත් වෙලා නාට්‍ය හා රංග කලාව හදාරා උපාධිය ලබාගන්න මට හැකි වුණා.

**පාසල් කාලයේ පටන් ඔබ කලාවට ළැදියි නේද?**

පාසල් කාලයේදී නිවේදකයකු, කථිකයකු විදිහට තමයි මාව හඳුනාගත්තේ. පාසලේ සාමාන්‍ය පෙළ හදාරන කාලයේ මම නර්තනය හදාරලා තියෙනවා. වෙස් නර්තන ශිල්පියෙක් විදිහට කලඑළි බසින්නත් හැකි වුණා.

> සාමාන්‍ය පෙළ හදාරන කාලයේ මම නර්තනය හදාරලා තියෙනවා.


**ඔබ ගුරුවරයෙක්. ගුරු වෘත්තිය එක්ක ඔබ කලා කටයුතුවලට ඉඩකඩ වෙන් කරගන්නේ කොහොමද?**

ප්‍රමුඛතාව ඉස්කෝලෙට සහ දරුවන්ට තමයි ලබා දෙන්නේ. කොච්චර කාර්යබහුල වුණත් කලා කටයුතු සඳහා මම කාලය වෙන්කර ගන්නවා. ඒ කටයුතු වෙනුවෙන් මගෙ පාසලේ හැමෝම මට ලොකු සහයෝග යක් ලබාදෙනවා. ඒ නිසා ගැටලුවක් නැතුව ඉස්කෝලෙ වැඩයි කලා කටයුතුයි දෙකම කරගෙන යනවා.

**මේ තරම් දුරක් එද්දී බාධක කම්කටොලුවලට මුහුණ දෙන්න ඇති?**

බාධක නම් ඕනෙ තරම් සිදුවෙලා ඇති. ඒත් ඒ හැම වෙලාවකම මාව රැකගෙන ඉස්සරහට ගෙනියන්න කවුරු හරි මට උදව් කරලා තියෙනවා. විශේෂයෙන් පාසල් කාලෙදි රමණි වන්නකු, රංජිත් ප්‍රේමතිලක, නන්දසෝම මුතුගල, පූර්ණා මංගෙදර, කුමාර අබේවික්‍රම, ධම්මී තොරණගොඩ වගේ ගුරුවරු එහෙම හයියටම ළඟ හිටපු අය. විශ්වවිද්‍යාල කාලෙදි කන්න, බොන්න අඳින්න ඉන්න මේ හැමදේම දුන්න හොරණ ජයවර්ධන පවුලේ හැමෝමත් එහෙම ළඟම ඉඳන් හයියක් වුණු අය. වටේ ඉන්න පිරිස් නිසාවෙන් ජීවිතේ කඩාවැටුණු අවස්ථාවන් ඇති වුණේ නෑ.

**සම්මාන ගැන බලාපොරොත්තුවක් නැද්ද?**



කාපු කට්ට

'කාපු කට්ට' මෙවර විශේෂාංගය සඳහා අප සමග එකතු වෙන්නේ ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයේ පසුතල නිර්මාණ ශිල්පියකු ලෙස නිර්මාණ රැසකට දායකත්වය ලබාදුන් චාමර ගමාරච්චිගේ. කලා ලොවට පිවිසීමට 'කාපු කට්ට' ගැන චාමර මතකය අවදි කළේ මේ විදියට .

චාමර ගමාරච්චිගේ

# වැඩකට බැස්සොත් ඉවර වෙනකම් කරනවා

**ඉතින් කොහොමද චාමර?**

හොඳින් ඉන්නවා. මේ දවස්වල 'සිහිනෙක තනිවෙලා' ටෙලිනාට්‍යයේ කලා අධ්‍යක්ෂවරයකු ලෙස වැඩකරගෙන යනවා.

**ඔබ ගැන මුලින්ම සඳහන් කළොත්?**

මගේ ගම් පළාත මාතර මොරවක. මම පාසල් ගියේ මොරවක කීර්ති අබේවික්‍රම ජාතික පාසලට. මම දැන් විවාහකයි. මට දරුවෝ දෙන්නෙක් ඉන්නවා.

**මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වෙන්න ඒ කාලේ කාපු කට්ට කොහොමද?**

මම ඒ කාලේ කොළඹට එන්නේ නළු නිළි වරම් තිර පරීක්ෂණයක් සඳහා. සුදර්ශියට ඇවිල්ලා ඒ සම්මුඛ පරීක්ෂණයට සම්බන්ධ වෙලා කොළඹ කොහේ හරි ෂූටින් එකක් තියෙනවා කියලා දැනගත්තොත් මම යනවා ඒක බලන්න. ඒ කාලේ මට තිබුණේ නළුවෙක් වෙන හීනයක්. මම කල්පනා කළා මේ ක්ෂේත්‍රයට සම්බන්ධ ජොබ් එකක් හොයාගත්තොත් මගේ හීනයට යන්න පුළුවන් වෙයි කියලා.

> ජොබ් එකක් හොයාගත්තොත් මගේ හීනයට යන්න පුළුවන්

මම ක්ෂේත්‍රයට සම්බන්ධ වුණු මුල් කාලේ නේරංජනා, මහරජ ගැමුණු, මායා රාජිනී ටෙලිනාට්‍යවල සුළු චරිත රඟපෑවා.

**එතකොට කලා අධ්‍යක්ෂණයට පිවිසුණේ?**

මම ඒ කාලේ දැන හඳුනාගත්ත කිහිප දෙනකු හරහා වෘත්තිමය මට්ටමෙන් සහාය කලා අධ්‍යක්ෂවරයකු ලෙස වැඩ කරන්න අවස්ථාව සලසා ගත්තා. ක්‍රිෂාන්ත රත්නසිරි මගේ ගුරුවරයෙක් හා සමානයි. ඔහු මට ගොඩක් දේවල් කියලා දුන්නා. මම අරුණ ජයවර්ධනගේ සක්කාරං, නේත්‍රා, නේරංජනා ටෙලිනාට්‍යවල සහාය කලා අධ්‍යක්ෂණය කළා. සරත් ධර්මසිරි, සමන් කුමාර ලියනගේ කියන ප්‍රවීණ අධ්‍යක්ෂවරුන්ගෙන් මගේ මේ වෘත්තිය ගැන ගොඩක් දේවල් ඉගෙන ගත්තා. පසුකාලීනව මට වැඩ කරන්න අවස්ථාව ලැබුණා සම්පත් වන්නිනායක සමග. ඔහු යටතේ සහාය කලා අධ්‍යක්ෂණ කටයුතු කළා. පසුව මේ වැඩකටයුතුවල තියෙන කාර්යබහුලත්වය වගේම වගකීම් වැඩි නිසා රංගන කටයුතු මගහැරුණා.

> එහාට මෙහාට පැනිලි නැහැ...

**ඔබේ ගමනට ලොකු කාලයක් ගියත් වැඩ කරපු නිර්මාණ ප්‍රමාණය අඩුයි නේද?**

එයට හේතුව මම වැඩකට සම්බන්ධ වුණොත් ඒ නිර්මාණයේ වැඩ අවසන් වෙනකම් එක දිගටම





ඇයි නැත්තෙ? මම වේදිකාවේදී බොහෝ අවස්ථාවල සම්මානයට සහ ඇගයීමට ලක්වෙලා තියෙනවා. නමුත් ටෙලිනාට්‍ය රංගනයේදී නම් සම්මානයට ලක්වෙලා නෑ. මම ජනප්‍රිය නළුවාට සහ නැගී එන නළුවාට නිර්දේශ වෙලා තියෙනවා. ඒ හැර ටෙලි සම්මානයක උස, බර, හැඩයවත් මම දන්නෙ නැහැ. ලැබෙනවා නම් ලැබේවි. නමුත් මට රසිකයන්ගේ ආදරය කියන සම්මානය ලැබිලා තියෙනවා. ඒක හැමදාටම තියේවි. අමාරුම සම්මානය ඒකනෙ. ඒක ලැබිලා තියෙනවා ඉතින්. ඒ ඇති.

**ආදරණීය බිරිඳ සහ පුංචි දෝණි සමග ගතකරන ජීවිතේ කොහොමද?**

අපි තුන්දෙනා හැම වෙලාවකම වගේ එකට ඉන්නේ. දුව තාම පොඩියි. ඉතින් එයාගේ හුරතල් වැඩ බල බලා තුන්දෙනත් එක්ක ගොඩක් සතුටින් ඉන්නවා.

**ඔබේ ඉදිරි නිර්මාණ කටයුතු මොනවද?**

ජීවා සහ මේඝ වර්ෂා කියන චිත්‍රපට දෙක ඉදිරියේදී තිරගතවීමට නියමිතයි. ඊට අමතරව කක්කුට්ටා සහ හොරු නැතුවත් බෑ කියන වේදිකා නාට්‍ය දෙකේ වැඩකටයුතු කරනවා. රූගත කරපු ටෙලිනාට්‍ය කිහිපයක් ඉදිරියේදී

## අලුත් වැඩකට අතගහන්න ඉන්නේ...

ස්ටෙෆනි කොතලාවල



වැඩ කරනවා. එක නිර්මාණයක ටික කාලයක් වැඩ කරලා තව නිර්මාණයකට ගිහින් වැඩ කරන්න යන්නේ නැහැ. විශාල නිර්මාණ ප්‍රමාණයකට සම්බන්ධ වෙන්න අවස්ථාව නොලැබුණේ ඒ නිසයි.

**තිරයෙන් පිටුපස ලොකුම කට්ට කන්නේ කලා අධ්‍යක්ෂවරුන්?**

අපේ වෘත්තිය වගේම අනෙකුත් ශිල්පීන් ගොඩ දෙනෙක් මහන්සි වෙනවා. හැඩට වැඩට ඇඳලා වැඩ කරන්න අමාරුයි මේ වෘත්තිය ඇතුළේ. ඒ වගේම දහඩිය මහන්සිය නොබලා වැඩ කරන්න වෙනවා නිරවුල් මනසකින්. රූගත කිරීම පටන් ගන්න කලින් ලෝකේෂන් එකට ඉස්සෙල්ලාම යන්නෙත් අපි. අවසානෙට යන්නෙත් අපි. මුළු දවසම ඇවිදලා දුවලා පැනලා සමහර වෙලාවට හිටගෙන ඉන්නවත් බැරි විදියට කකුල් කැක්කුමයි. සමහර දවස්වලට පාන්දර ෂූටින් ඉවර වෙලා ගිහින් වොෂ් එකක් දාගෙන පසු දින රූගත කිරීම් සඳහා යන්න වුණු අවස්ථා තිබුණා. හරි නින්දක් පවා නැති වෘත්තියක් තමයි මේක. කාපු කටු එමටයි. මේක ලේසි පහසු රැකියාවක් නම් නෙවෙයි.

## මට තිබුණේ නළුවෙක් වෙන හීනයක්...

**කාපු කට්ටේ අමතක නොවන සුන්දර මතකත් ඇති?**

ෂූටින් ඉවර වෙලා ගෙදර යනකොට කොළඹ කොටුවේ අනන්තවත් නිදාගෙන ඉඳලා තියෙනවා. මට එතකොට වයස අවුරුදු 20ක් විතර ඇති. මම මාතරින් මොරවකට යන්න ඕනේ නිසා ගමට යන බස් එක අල්ලගන්න පාන්දරින් තමයි කොටුවට යන්නේ. ඒ ගෙවපු කාලය අමතක කරන්න බැරි තරම්. ඒ කාලේ මම දන්න කියන කවුරුවත් හිටියේ නැහැ කොළඹ.

වසන්ත විතාරණගේ

# මඩ නාගෙන අමුඩ ගහලා කඩවත හොල්ලපු ජෝසියා...



## කවිඳු යසස්

යූටියුබ් ඔස්සේ සිය ගමන ආරම්භ කරමින්, අද ටෙලි තිරයේත් ආදරය දිනාගත් ඔහු තරුණ රංගන ශිල්පියෙක්. රටක් ආදරය කරන ලෝචිගේ යූටියුබ් නිර්මාණ සමග එක්වෙමින් ජනප්‍රියත්වයට පත්ව ආදරණීය චරිත රැසක් හරහා ප්‍රේක්ෂක හදවත් වෙත සමීපව 'ජෝසියා' ලෙසින් වඩාත් ප්‍රසිද්ධියට පත් ඔහු නමින් කවිඳු යසස්. ඉතින් අද 'මව්රට' 'හාට්' කතාබහට එක් වූයේ ඔහුයි.



**කවිඳු කියන්නද ජෝසියා කියලා කතා කරන්නද?**

කැමැති විදිහට කතාකරන්න කිසි අවුලක් නැහැ.

**කොහොමද කවිඳු 'ජෝසියා' වුණේ ?**

ඒක පොඩි කාලේ යාළුවෝ සෙල්ලම් කරද්දී දාපු නමක්.

**ඒ කියන්නේ ලෝචිගේ චැනල් එකට හැදුණු නමක් නෙමෙයි?**

නැහැ. ජෝසියා කියන නම ලෝචි අක්කා එක්ක වැඩ පටන් ගන්නකොටම හැදිලා තිබුණෙ. යාළුවෝ හැමෝම මාව දන්නෙත් ජෝසියා කියන නමින්.

**කවිඳුට කොහොමද ලෝචිව හඳුනා ගන්න ලැබෙන්නේ?**

අපි දෙන්නම කැස්බෑවේ. ගමේ වුණාට අපි එකිනෙකා දැන හඳුනාගෙන තිබුණේ නැහැ. මම ලෝචි එක්ක සම්බන්ධ වෙන්න කලින් පොඩියට තනියම යූටියුබ් චැනල් එකක් කළා. ලෝචි අක්කා කෙනෙක්ව හොයලා තිබුණා වැඩකට. ඊට පස්සේ ලෝචි අක්කගේ චැනල් එකේ ඉන්න චමත් අයියා මාව යෝජනා කළාට පස්සේ තමයි මට ලෝචි අක්කා එක්ක සම්බන්ධ වෙන්න පුළුවන් වුණේ. ඒ දැනට අවුරුදු හතරකට පහකට ඉහතදි.

**ලෝචි නිසා ඔබේ ජීවිතේ වෙනස් වුණා නේද?**

මගේ ටර්නින් පොයින්ට් එක තමයි ලෝචි අක්කා. මාව ප්‍රේක්ෂකයන් අතරට ගෙනගියේ ලෝචි අක්කගේ යූටියුබ් චැනල් එක නිසා.

**ලෝචිගේ දැන් වැඩ ගොඩකට සම්බන්ධ වෙලා ඇති?**

ගණන් කරලා කියන්න බැරි තරම් කන්ටෙන්ට් ප්‍රමාණයකට සම්බන්ධ වුණා. යූටියුබ් ඇතුළුව සම්බන්ධ වූ සියලු නිර්මාණ දෙසීයකට වැඩි මිසක් අඩු නැහැ.

**කැමරාවකට මුහුණ දුන් පළමු රංගන අත්දැකීම?**

යූටියුබ් එකෙන් තමයි මට ඒ අත්දැකීම ලැබුණේ.

**මේ දිනවල වැඩකටයුතු?**

සුපුරුදු විදිහට ලෝචි අක්කගේ වැඩ ටික කරගෙන යනවා. ඊට අමතරව ටීවී දෙරණ නාලිකාවේ 'මං ආදරෙයි' ඩ්‍රාමා එකේ ෂූටිං කරගෙන යනවා.

**'මං ආදරෙයි' ඩ්‍රාමා එකට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබුණේ කොහොමද?**

ශලිනි ෆර්නැන්ඩු අක්කාගේ ආරාධනාවකින් තමයි සම්බන්ධ වෙන්න ලැබුණේ. මුලින්ම මට කතා කළේ හර්ෂ උඩකන්ද අයියා අධ්‍යක්ෂණය කරපු 'ප්‍රාර්ථනා' නාට්‍යයට. නමුත් මං ඒ කාලේ කරපු ජොබ් එක නිසා මට ඒකට සම්බන්ධ වෙන්න බැරි වුණා. ඉන් පස්සේ තමයි මේ නාට්‍යයට සම්බන්ධ වුණේ.

**දැන් ඔබ ජොබ් එක අතහැරලද ඉන්නේ?**

ඔව්. දැන් ජොබ් එක අතහැරලා රංගනයට මුල්තැන දීලා ඉන්නේ. ජොබ් එක එක්ක රංගන කටයුතු කරන්න අපහසු නිසා.

## ජීවිතේ ලොකුම ටර්නින් පොයින්ට් එක ලෝචි අක්කා...

**කවිඳුට මතකද ජීවිතේ වැඩියෙන්ම සතුටු වුණු දවස?**

ලෝචි අක්කා එයාගේ යූටියුබ් චැනල් එකට කතා කරපු දවසේ තමයි ගොඩක්ම සතුටු හිතුණේ.

**රංගනයේදී අමතක නොවන මතක?**

අසුන්දර මතකයක් තියෙනවා. 'මං ආදරෙයි' ඩ්‍රාමා එකේ තේමා ගීතය ෂූට් කරන්න යෙදුණු දවසේ තමයි මගේ තාත්තා නැති වුණේ. ඉතින් මට රූගත කිරීම්වලට යන්න වුණේ නැහැ. ලෝචි අක්කගේ වැඩකදි අමුඩයක් ඇදගෙන මඩ නාගෙන මගේම වාහනෙ පැදගෙන ගියපු අවස්ථාවකුත් තියෙනවා කඩවත පැත්තේ කළ රූගත කිරීමකින් පස්සේ. ඒ මතකයත් අමතක කරන්න බැහැ.

## ජොබත් අතහැරියේ ආසාව පස්සේ යන්න...

**ඉදිරි බලාපොරොත්තු?**

රඟපාන්න තිබුණු ආසාව නිසා තමයි මම ජොබ් එකෙන් අයින් වෙලා රංගනයට යොමු වුණේ. ඉතින් කලාව පැත්තෙන් ඉදිරියට යන්න බලාපොරොත්තු වෙනවා.

ස්ටෙෆනි කොතලාවල



# තිරුවට වුණත් පෙන්වත ඇට එකක් තියෙනවා...

## ලක්ෂිකා ජයවර්ධන

**හීන දැකලා පෙරුම් පුරලා රංගන කලාවට එන නිළියන් වගේම නිළියක් වෙන හීනේ හිතේ අහලකවත් නොතිබුණු, ඒත් අහම්බයකින් වගේ රංගන කලාවට ආපු නිළියොත් ටෙලි වගේම සිනමා කලාවෙත් ඉන්නවා. ලක්ෂිකා ජයවර්ධන කියන්නෙත් හීන නොදැකම අහම්බයක් හරහා රංගනයට මැදිවුණු නිළියක්. ලක්ෂි ලස්සනයි. ඈ හුඟ ක්ම කැපීපේන්නේ මූණේ වම් පැත්තේ උඩු තොලට සමීපව තියෙන උපන් ලපය නිසයි. 'කොටු' ටෙලියේ ආලකමන්දාව හෝටලයේ අනුන්ගේ ඕපාදූප හොයන වේටර් කසුන් 'මූණේ ලපයක් තියෙන කෙල්ල' කියලා ලක්ෂිව හඳුන්වලා දෙන්නෙත් ඒ උපන් ලපය ඇගේ ඇඩකාර පෙනුමට විශේෂයක් වුණු නිසාමයි. ඔන්න ඉතින් මේ පෙළග ැහෙන්නේ ලක්ෂි 'හාට්' එකට ඇවිදින් දොඩමළු වෙච්ච විනාඩි ගණනක විරාමයයි.**

**කොහොමද ලක්ෂි ඉතින් ජීවිතේ?**

ජීවිතේ හරිම සුන්දරව සරලව ගලාගෙන යනවා. මම ඒ සුන්දර සරල බව මැද්දේ කාලයට මුහුණ දීලා මගේ ගමන සතුටින් යනවා.

**උත්තරය නම් අපූරුයි. මේ දවස්වල මොනවද වෙන්නේ කිව්වොත්?**

මේ දවස්වල ඉතින් සාමාන්‍ය විදියට ෂූටින් ඩබින් අතර දවස ගෙවෙනවා. 'කොටු' සහ 'බෝල්ටි ඇණයක්' විකාශය වෙනවා. ඉදිරියට මගේ අලුත්ම ටෙලිය 'හඳට හැතැප්මයි' ජාතික රූපවාහිනියේ විකාශය වීමට නියමිතයි.

**නිළියක් වුණේ හිත කොනකවත් තිබුණු බලාපොරොත්තුවක් නිසා නෙවෙයි?**

සත්තකින්ම ඇත්ත කතාව ඒකයි. අදත් මම වෙලාවකට නැවතිල්ලේ හිතන අවස්ථා තියෙනවා කොහොමද මම නිළියක් වුණේ කියලා.

**සතුටින්ද ඉන්නේ ඒ අහඹු නිළිකම ගැන?**

කියන්න වචන නැති තරම් සතුටක තෘප්තියකයි මම ඉන්නේ ටෙලිවලට, චිත්‍රපටවලට ආරාධනා එනකොට. ඒ අහම්බයෙන් පැමිණි නිළි වරම ගැන පුදුම සතුටක් දැනෙනවා.

**ගෙදරින් ඒ තරම් මනාප වුණේ නැහැ ඔබේ නිළිකමට?**

අම්මලාට ඕනෙ වුණේ මම ඉහළට ඉගෙනගන්නවා බලන්නයි. මගේ අක්කලා දෙන්නගේ බලාපොරොත්තුව වුණෙත් ඒකමයි. ඒ නිසා මම නිළියක් වෙන එකට එයාලා ටික්ක අවුල් වුණා.

**නිළිකම නිසා උසස් අධ්‍යාපනය අවුල් වුණාද?**



කොහොමටවත් නැහැ. රඟපෑමට තාවකාලිකව තිත තියලා මම මගේ උසස් අධ්‍යාපනයට සිංගප්පූරුවට ගියා. ඒ ඩිප්ලෝමාව සාර්ථකව නිමා කරලා තමයි නැවත ලංකාවට ආවේ.

**ලක්ෂි ඔය කියන විරාමය ගත්තේ කොයි කාලෙද කියනවා නම්?**

මම මේ කියන්නේ කොරෝනා කාලෙට ටිකක් කලින් කාලවකවානුව ගැනයි. 2014 'සුපිරි අන්දරේ' ෆිල්ම් එකෙන් තමයි හඳුන්වා දෙන නිළියක් විදියට මම ක්ෂේත්‍රයට ආවේ. එතැනින් පස්සේ රංගනයට තව තවත් ආරාධනා ආවත් භාරගත්තේ නැහැ. අන්න ඒ කාලේ තමයි මම විදේශගත වුණේ.

**'සුපිරි අන්දරේ' සුපිරියට හිට් වුණා නේද ලක්ෂි?**

මාරම සතුටක් දැනුණා මගේ ෆස්ට් ෆිල්ම් එක ඒ විදියට ජනප්‍රිය වෙනකොට. අනෙක මම රංගනයට මැදි වුණේ රොඩ්නි වර්ණකුල, සනෝජා බිබිලේ, තිස්ස විජේසුරේන්ද්‍ර, ටෙනිසන් කුරේ, රූපා ගෝමස් වැනි ප්‍රවීණයන් සමගයි. අනේ ඔවුන් මට දුන් සහාය හරිම ආදරණීයයි. නවකයෝ විදියට අපි හරි ගරුත්වය ඔවුන්ට දෙනවා නම් ඔවුන් අපිටත් ඒ විදියට සහාය සහ අත්වැල දෙනවා.

**ලංකාවට ආවාට පස්සේ ආයෙම රංගනයට එනවා?**

ඒකත් අහම්බයක් විදියට තමයි වෙන්නේ. මාවෝ ලක්ෂිත අයියා මට කතා කරනවා 'ෆ්ලැට් නොවන ෆ්ලැට්' ටෙලි ඩ්‍රාමා එකට. රංගනයෙන් දායක වෙන්න ඕනේ කියලා හිතන්නත් කලිනුයි ඒ ආරාධනාව එන්නේ.

**සතුටින් භාරගත්තද ඒ ආරාධනාව?**

මොනවද කියන්නේ. ලක්ෂිකා ජයවර්ධන ෆීල්ඩ් එකට අවශ්‍යයි කියන හැඟීම ඔවුන් මට දෙනකොට පුදුමාකාර සතුටක් දැනුණා. අනෙක මාවෝ ලක්ෂිත වැනි හිතට දැනෙන යමක් කරන ප්‍රවීණයෙකුගෙන් ඒ ආරාධනාව එනකොට අහිංසක ආඩම්බරයක් දැනුණා.

**'ෆ්ලැට් නොවන ෆ්ලැට්' ප්‍රේක්ෂකයන්ට බොහෝ සමීප ටෙලියක් වුණා?**

එච්. දින නියමයක් නැතුව දුවන ටෙලි අතරට කොටස් 60ක විතර ටෙලියක් ආවාම ප්‍රේක්ෂකයන් ඊට සමීප වෙනවා. අනෙක ජාතික රූපවාහිනියේ විකාශය වන ටෙලියක් කිව්වාම ඇයිද මංදා කවුරුත් ඒ ගැන උනන්දුයි. ඒ වගේම ෆ්ලැට් නොවන ෆ්ලැට් වත්මන් සමාජයේ සංකීර්ණ සිදුවීම් ගැන කතාකරන ටෙලිනාට්‍යයක්. ඒ නිසාම එය ආලින්දයේ සිනමාවට සමීප වුණා. ඒ වෙලාවට නාට්‍යය බලන්න බැරිවෙන බොහෝ දෙනා එය යූටියුබ් හරහා නැරඹුවා.

**ලක්ෂිට බොහෝ ප්‍රතිචාර ලැබුණු බවයි අහන්න ලැබුණේ?**

අනිවාර්යයෙන්ම. 'ෆ්ලැට් නොවන ෆ්ලැට්' ටෙලියේ උදාරිගේ චරිතයට මට හොඳ ප්‍රතිචාරයක් ලැබුණා.

**2025 සුමති ටෙලි සම්මාන උළෙලේ හොඳම නැගී එන නිළි සම්මානයට පවා ඔබ නොමිනේට් වුණා?**

ඔව්. නොමිනේට් වෙනවා කියන්නෙත් ඉතින් යම්



# හැමෝම කියන්නේ මම හොඳට රඟපානවා කියලා...

## ඉතාරා බෝමන්දි

# බෝල්ටි ඇණ හොල්ලන පුංචි කටකාරි...



**'බෝල්ටි ඇණ' කිහිපයක් එකතුවෙලා කරන පෙරළිය ගැන පසුගියදා අපි ඔබව දැනුවත් කළා මතක ඇති. අන්න ඒ බෝල්ටි ඇණ මැද්දට වැදිලා, තමන්ගේම අනන්‍යතාවකින් මුළු ටෙලි තිරයම තමන්ගේ පැත්තට නම්මා ගන්න සමත් වුණු කටකාර, දඟකාර පුංචි සුරංග නාවියක් තමයි ඉතාරා බෝමන්දි කියන්නේ. 'බෝල්ටි ඇණේ' මිනෝලි විදිහට ප්‍රේක්ෂක හදවත්වල ලැගුම්ගත් මේ අපූරු දියණිය, අද 'හාට්' කලා අතිරේකය හැඩකරන්න අපේ කතාබහට එකතු වුණේ මෙන්න මේ විදිහටයි...**

**අපි කැමැතියි මුලින්ම දුව ගැන දැනගන්න?**

මම ඉතාරා බෝමන්දි. මට වයස අවුරුදු 9ක් වෙනවා.

**එතකොට ඔයා ඉගෙනුම ලබන්නේ?**

ඔරුවල විද්‍යාලයේ 4 වසරේ මම ඉගෙනුම ලබනවා. පාසලෙන් මගේ රංගන කටයුතුවලට ලොකු සහායක් ලැබෙනවා. විදුහල්පතිතුමිය සහ පාසලේ අනෙකුත් ගුරුවරු මගේ රඟපෑම ගොඩක් අගය කරනවා. ඒ වගේම මගේ යාළුවොත් මට සහාය දෙනවා. එයාලා මට අතපසු වෙන පාඩම් කටයුතු කරගෙන යන්නත් උදව් කරනවා.

**දුව රංගන කටයුතුවලට සම්බන්ධ වුණු ආකාරය ගැන කතා කළොත්?**

# දෙන්න පුළුවන් උපරිමය දෙනවා...

## ඒ මගේ හැටි...

# අම්මා රඟපානවා දැකලා මටත් ආස හිතුණා රඟපාන්න



මම මුලින්ම සම්බන්ධ වෙන්නේ වෙළෙඳ දැන්වීම්වලට. සිතාරා ආන්ටි හරහා 'විසේකාරි' ටෙලිනාට්‍යයේ චනුකිගේ චරිතය රඟපාන්න මට අවස්ථාව ලැබුණා. චේතිය සර්ගේ පොඩි දුවට පස්සේ 'මගේ ආදරේ' ටෙලිනාට්‍යයට සම්බන්ධ වුණා. ඒ නාට්‍යයේ මම රඟපෑවේ බිමල් අංකල් සහ පබෝදා ආන්ටිත් එක්ක.

**දුවගේ පවුලේ ගොඩ දෙනෙක් කලාවට සම්බන්ධයි නේද?**

මගේ අම්මා තමයි රෝමා රෝෂි. අම්මා ටෙලිනාට්‍ය, වේදිකා නාට්‍ය, චිත්‍රපටවල රඟපානවා. මගේ තාත්තා රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදකවරයෙක් වගේම අධ්‍යක්ෂවරයෙක් ලෙස කටයුතු කරනවා. මගේ අයියා තමයි දුවින් දසස්. එයත් ටෙලිනාට්‍යවල රඟපානවා. අම්මා ටෙලිනාට්‍යවල රඟපාන්න යනකොට මාවත් එක්කගෙන යනවා. ඉතින් අම්මා රඟපානවා දැකලා මටත් ආශා හිතුණා රඟපාන්න.

**'බෝල්ටි ඇණයක්' එකේ මිනෝලි ගැන කතා කළොත්?**

චතු ගම්ලත් ආන්ටි හරහා තමයි මට බෝල්ටි ඇණයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබුණේ. හැමෝම කියනවා මම හොඳට රඟපෑවා කියලා. මිනෝලිට ගොඩ දෙනෙක් ආදරෙයි.

**මිනෝලි චරිතය වෙනුවෙන් විශේෂ දෙයක් එකතු කරගත්තද?**

ඒ චරිතය වෙනුවෙන් මම රංගනය තුළදී එකතු කරගත්තේ කටකාරකම තමයි. ටෙලිනාට්‍යයේ අධ්‍යක්ෂ අංකල් සහ අනෙකුත් අය කියන දේවල් අවබෝධ කරගෙන චරිතය උපරිම විදියට මම රඟපෑවා.

**'බෝල්ටි ඇණයක්' රූගත කිරීම් අතරතුර හොඳ හොඳ වැඩ වුණාලු නේද?**

මගේ අම්මාට රඟපාන්නේ ලක්ෂිකා ආන්ටි. කිරි අම්මාට රඟපාන්නේ ශිරෝමිකා ප්‍රනාන්දු ආන්ටි. කිරි අම්මා එක්ක තමයි මම නිතරම එකට එක කියාගෙන යන්නේ. දවසක් රූගත කිරීම් අතරතුර එක දර්ශනයක තිබුණා කිරි අම්මා පුටුව උඩ නැගලා ජනේලයෙන් බලාගෙන ඉන්නවා. මමත් ඒ පුටුවටම නැගලා ජනේලයෙන් බලන්න ගිහින් දෙන්නත් එක්කම බිමට ඇදගෙන වැටුණා.




**වසන්ත විතාරණගේ**

# ආදරෙන් විඳවන්න බයයි...

## හීන නොදැකම අහම්බෙන් ඇවිත්

# තරු වැස්සේ මායා මවන මූණේ ලපේ තියෙන හැඩකාර කෙල්ල...



චරිතයකට හිමිවිය යුතු සම්මානනීය අගැයීමක් ලැබුණා කියන එක තමයි.

**එයින් පසු ඔබ නැවතත් රංගනයට අවතීර්ණ වුණා?**

දිගින් දිගටම චරිත ලැබුණා. කාලවේලාව අනුව ඒවා තෝරා ගත්තා. 'ඔෆිස්ලන්තය', 'තත්පරයක් දෙන්න' වැනි එකිනෙකට වෙනස් චරිතවලට මැදිවෙන්න ලැබුණා.

**වැඩිපුරම ඔබට කොටුවෙන්න ලැබුණේ නාගරික සහ වෙස්ටර්න් චරිත අතරට?**

ඒක බොහොමයක් කලාකාරියන්ට වෙන සංසිද්ධියක්. එන්නේ මොන වගේ චරිතයක්ද, දිගින් දිගටම ලැබෙන්නේ අර පළමුව ලැබුණු චරිත ස්වභාවයටම ගැළපෙන චරිතමයි. හැබැයි 'ඉඩෝරයට පොද වැස්සක්' චරිතය තුළින් ගැමි චරිතවලටත් මම සුදුසුය කියන හැඟීම කාටත් දැනුණා.

**'ෆ්ලැට් නොවන ෆ්ලැට්' ටෙලියේ උදාරිගේ චරිතය තුළ ඔබ බොහෝ හැඟීම්බර නිරූපණයක යෙදුණා?**

මට ලැබෙන හැම චරිතයකටම ඒ හැඟීම්බර නිරූපණය මම තිළිණ කළා. මට හැකි උපරිමය දුන්නා. ඒක මගේ විදිය. ලැබෙන චරිතය මොකක්ද, එය සංකීර්ණද, සරලද, කොමඩියක්ද කියන එක මට අවුලක් නැහැ. හැබැයි ඒ චරිතයට උපරිම සාධාරණයක් කළොත් තමයි මම සෑහීමකට පත්වෙන්නේ.

**'රාවණා' වැනි උසස් නිර්මාණයකට දායක වෙන්නත් ඔබේ නිළි ජීවිතය තුළ ඔබට අවකාශ ලැබුණා?**

මැදි වුණේ නැහැ. අනෙක දැනට මගේ ලොකුම හීනය රංගන ජීවිතයේ ස්ථාවර තැනක් හදාගන්න එකයි. මට තවම හැදෙන්න තියෙන තැන් බොහොමයි. මගේම කියලා ශෛලියක් අනන්‍යතාවක් හදාගන්න තියෙන ඕනෑකම තුළයි මම දැන් ඉන්නේ. ඉන් පස්සේ තමයි අනෙක් දේවල් ගැන හිතන්නේ.

ඒක මගේ වාසනාවක්. ඇත්තටම ලොකු සතුටක් හිතට දැනුණා ඒ වගේ මහා පරිමාණයේ චිත්‍රපටයකට ආරාධනා ලැබෙන කොට.

**සෝෂල් මීඩියාවල නිරූපණයන් මවන විට ඔබ අඳින පලඳින සමහර විලාසිතා ගැන චෝදනා තියෙනවා?**

ඕනෑම කෙනකුට පුළුවන් තම තමන්ගේ මත ඉදිරිපත් කරන්න. ඒක වරදක් නෙවෙයි. මම කරන දේ මගේ හිතට එකඟයි නම්, එහි වරදක් පෙනෙන්නේ නැතිනම් මම වෙනත් කෙනකුගේ අනවශ්‍ය චෝදනාවලින් සැලෙන්නේ නැහැ. මගේ විලාසිතාවලටත් එය අදාළයි.

**ලක්ෂි පෙම්වතියක්ද කියන ප්‍රශ්නය ඇහුවොත් උත්තර දෙනවද?**

ඇයි නොදෙන්නේ? මම ප්‍රශ්නවලට බය නැහැ. ඔන්න මගේ උත්තරය. මට තවම පෙම්වතෙක් නැහැ. ආදරෙන් පැරදෙන්න, මට හිමිවෙලා තිබ්බ ආදරයක් අහිමි වෙනවා දකින්න මම කැමැති නැහැ. මට ඒ වගේ අහිමි වීමක් දුකක් දරාගන්න අමාරුයි. ඒ නිසා තවම ආදරයකට

> චරිතාංග නිළියක ලෙස සම්මානනීය චරිතයක් කරන්න ලොකු හීනයක් තියෙනවා.

**සුවිශේෂ හීන තියෙනවද?**

සහතික වශයෙන්ම මට හීන තියෙනවා. විශේෂයෙන්ම චරිතාංග නිළියක ලෙස සම්මානනීය චරිතයකට දායක වෙන්න ලොකු හීනයක් තියෙනවා.

**යම් මාධ්‍යයකට ඔබ කියා තිබුණා සම්මානනීය චරිත නිරූපණයක් වෙනුවෙන් අඩනිරුවතට වුණත් සූදානම් කියලා?**

මම මෙහෙම උත්තරයක් එයට දෙන්නම්. නිරුවත වුණත් පෙන්වන කලාවක් තියෙනවා. යම් සීමාවක් තියෙනවා. සම්මානනීය හොඳ චරිත නිරූපණයක් වෙනුවෙන් චරිතාංග නිළියක ලෙස යම් සීමාවකට අනුව එවැන්නකට මැදිවීමේ වරදක් නැහැ කියලා මම හිතනවා. ඒ සිතුවිල්ල තුළ තියෙන්නේ සම්මානයක් වෙනුවෙන් ඕනෑම නිරුවතකට මම සූදානම් කියන අදහස නෙවෙයි. තිරපිටපතක් ලැබුණාම නිළියක ලෙස මමත් විමසා බලන සීමා තියෙනවා. මම රඟපාන්නේ ඒ සීමාවන්ට අනුවයි.



**මල්මි කෞෂල්‍යා**

# බොඳ මීදුමෙන් මතු වුණු ටෙලි සිත්තම් හැඩ කළ අංජලී...

## විහිළුවක් වෙන්න කැමැති නැහැ

අංජලී ලියනගේ

'බොඳ මීදුම්' නවකතාවේ පිටකවරයට පෙනීහිටපු ඒ ආදරණීය රුව ඔබට තවමත් මතක ඇති. එතැනින් පටන් ගත්ත ඇගේ කලා ජීවිතය, පස්සේ කාලෙක පුංචි තිරය හැඩකරපු දක්ෂ රංගන ශිල්පිනියක් දක්වාම දුර ගියා. ඇය නමින් අංජලී ලියනගේ. කාලෙන් කාලෙට අපූරු චරිත හරහා ප්‍රේක්ෂකයන් හමුවට ආපු අංජලී, මේ දවස්වල නම් කැමරා ඇස්වලින් මිදිලා ටිකක් නිදහසේ ඉන්නවා කියලා අපිට ආරංචි වුණා. කලාව පැත්තකින් තියලා, මේ දවස්වල ඇය වැඩිපුරම කාලය වෙන් කරලා තියෙන්නේ පිනට දහමටලු. ඉතිං දැන් හිතේ සැනසීමෙන් ඉන්න අංජලී, ඇගේ අලුත්ම තොරතුරු 'හාට්' අපිත් එක්ක බෙදාගත්තේ මෙන්න මේ විදිහටයි...

**මේ දිනවල අංජලී රංගනයෙන් ඈත්වෙලා පිනට දහමට මුල් තැන දීලා කියලා ආරංචියි?**

මේ දිනවල මම ටික්ක විවේකීව ඉන්නවා. මම භාරගත්තු පින් කටයුතු ටිකක් තිබුණා. මේ දැනුත් මම ඒ දැහැමි කටයුතුවලට සම්බන්ධ වෙලයි ඉන්නේ. පවුලේ අය සහ මගේ හිතවතුන් කිහිප දෙනෙක් සමග එකතු වෙලා රුවන්වැලි සෑයේ ලොකු පින්කමක් කළා පහුගිය දවස්වල. එක දිගට වැඩ කරපු නිසා මේ දවස්වල ආගමික කටයුතු වෙනුවෙන් මුල් තැන දීලා ඉන්නවා. අනෙක මේ දිනවල පොසොන් පින්කම් නිසා මම ඒ කටයුතුවලටත් සම්බන්ධ වෙනවා.

**කාලෙන් කාලෙට ඔබ විවිධ චරිත හරහා අප අතරට එනවා. තොරලා බේරලාද චරිත භාරගන්නේ?**

අපි යම් නිර්මාණයක එක චරිතයක් කළොත් ඒ විදියේ චරිත සඳහාම අපිව කොටු කරගන්න හදනවා. මුල් කාලයේ ඒ ගැන මම ලොකුවට හිතුවේ නැහැ. මට ලැබෙන හැම චරිතයක්ම භාරගෙන කළා. නමුත් මට කාලෙකදි දැනුණා එකම රාමුවකට කොටුවෙනවා කියලා. ඒ ගැන හිතලා අලුත් නිර්මාණයකට පිටපතක් මට ලැබෙනකොට ඒකාකාරී නොවන විදියේ චරිත තෝරාගන්න මම තීරණය කළා. මම වගේම ඕනෑම ශිල්පියෙක් ශිල්පිනියක් කැමැතියි විවිධාකාර චරිත රඟපාන්න. ඒ අනුව මට පසුගිය දවස්වල වෙනස්ම චරිත කිහිපයකට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබුණා. උදාහරණයක් විදියට කිව්වොත් 'මා' ටෙලිනාට්‍යයේ ලීලාවතී කියන්නේ මට ලැබුණු එවැනි විශේෂ චරිතයක්.

> **කාලෙකදි දැනුණා එකම රාමුවකට කොටුවෙනවා කියලා.**

**ලීලාවතී පැති කිහිපයකට දිවගියා?**

ඔව්. 'මා' ටෙලිනාට්‍යය අධ්‍යක්ෂණය කළේ ඉරේෂ් ලොකුබණ්ඩාර. මහේෂ් රත්සර මද්දුමආරච්චි තමයි එය රචනා කළේ. ගොඩක් ලස්සන පිටපතක්. ඒ වගේම මම කාලෙකින් ආශාවෙන් සම්බන්ධ වුණු චරිතයක් තමයි ලීලාවතී කියන්නේ. මොකද ඒක වෙනස්ම විදියේ මවකගේ චරිතයක්. ලීලාවතී දිරිය මවක්.

ඇය තම දරුවන් වෙනුවෙන් පමණයි ජීවත් වෙන්නේ. වෙරළබඩ ප්‍රදේශයේ දුෂ්කරතා මැද ඇයගේ ජීවිතය ගලාගෙන ගිය විදියට මම ගොඩක් කැමැති වුණා.

පසුකාලීනව 'දොරකඩ දෙවොල' ටෙලිනාට්‍යයේ ප්‍රේමා චරිතයත් විශේෂයි. ප්‍රේමා වගේ එකම චරිත කරන්න මම කැමැති නැහැ.

**අංජලී කැමැති ශක්තිමත් චරිතවලට?**

ඇත්තටම ඔව්. මම කැමැති නැහැ චරිතවලට විහිළුවක් වෙන්න. මට අවුරුදු 20ක කෙනෙක්ගේ චරිත රඟපාන්න බැහැ.

අපි දැනගන්න ඕනේ අපේ වයසත් එක්ක ප්‍රේක්ෂකයන් අපිව පිළිගන්න, ප්‍රේක්ෂකයන්ගේ මතකයේ රැඳෙන චරිතයක් වෙන්න. අපිට ලැබෙන චරිතය ශක්තිමත් වෙන්න ඕනේ. හොඳ දෙයක් ප්‍රේක්ෂකයන්ට දුන්නොත් ඔවුන්ට හැමදාමත් අපිව මතකයේ තියේවි.

මට ලැබෙන චරිතයට පුළුවන් උපරිම සාධාරණයක් කරනවා. මම ඒ වෙනුවෙන් කැපවෙනවා.

**ඒ මහන්සියට සාධාරණ ගෙවීමක් ලැබෙනවා නේද?**

ඔව්. මගේ මහන්සියට මට ගෙවීමක් කරනවා. මම වැඩකරපු නිර්මාණවල හොඳ නිෂ්පාදකවරුන් හමුවුණා. මගේ උපරිම දායකත්වය දෙනවා නම් අනෙක් පැත්තෙනුත් ඒ විදියටම සාධාරණයක් වෙනවා. මොකද මම වෘත්තීය මට්ටමෙන් මේ ක්ෂේත්‍රයේ වැඩ කරන්නේ. එහෙම නොවෙනවා නම් මම සම්බන්ධ වෙන්නේ නැහැ. ඒ වගේම අනෙක් පැත්තෙන් යම් අසාධාරණයක් වුණොත් මම නිර්මාණයෙන් ඉවත්වෙලා දමලා ගහලා යන්නේ නැහැ. නිෂ්පාදනය පැත්තෙන් ප්‍රශ්න වුණත් මගේ වගකීම හරියට කරනවා.

මොකද නිර්මාණයට හානියක් කරන්න බැරි නිසා. මේ වෙනකම් මම වැඩ කරපු හැම නිර්මාණයකම කිසිම ප්‍රශ්නයක් නැතුව සතුටින් මගේ වගකීම මම හරියට කළා.

> **මම නිර්මාණයෙන් ඉවත්වෙලා දමලා ගහලා යන්නේ නැහැ.**

**ප්‍රේක්ෂක පිරිසක් එකතු වෙන තැන ඔබ ඔවුන්ට දක්වන ප්‍රතිචාරය කොහොමද?**

මම සාමාන්‍ය ගෘහණියක්. මගේ එදිනෙදා වැඩකටයුතුවලදී ප්‍රේක්ෂකයන් හමුවෙනවා. ප්‍රේක්ෂකාගාරයක් ඉන්න නිසානේ අපි මේ වැඩ කරන්නේ. මම රඟපාන ටෙලිනාට්‍යවල චරිතවලට කැමැති ප්‍රේක්ෂකයන් මට හමුවෙනවා. ඔවුන් මම අනුරාධපුරේ, පොළොන්නරුවේ මේ ආපු ගමනේදිත් මා සමග කතාබහ කළා. ප්‍රේක්ෂකයන් අපිට ආදරේ නිසයි අපි අදටත් මේ වෘත්තියේ සතුටින් වැඩ කරගෙන ඉන්නේ. ඔවුන්ගේ ආදරය නිසයි අපිට ජවයක් ලැබෙන්නේ.

> **හොඳ දෙයක් දුන්නොත් හැමදාම මතක තියෙවි...**

**ඔබට එක්තරා විශේෂ අවස්ථාවක් හිමිවුණු නිසයි අද මේ තරම් දුර ගමනක් යන්න වරම් ලැබුණේ?**

සුජීව ප්‍රසන්න ආරච්චිගේ 'බොඳ මීදුම්' නවකතාවේ පිටකවරයට මට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබුණා. මම ගොඩක් වාසනාවන්තයි. මම ඒ අවස්ථාව නිරන්තරයෙන් මතක් කරනවා.





> **රුවන්වැලි සෑයේ ලොකු පින්කමක් කළා...**

වසන්ත විතාරණගේ




## ධනය ගිලිහෙනවාද?

**'වාස්තු පුරුෂයා' නම කියූ සැණින් බොහෝ දෙනෙක් දැන සිටියද ඒ කිසිවකු වාස්තු පුරුෂයාගේ සැබෑ බලය නොදන්නා බව නම් රහසක් නොවේ. යම් භූමියක ශක්තිය දැක්වීමට සහ හඳුනාගැනීමට මෙම වාස්තු පුරුෂ සංකල්පය ඉතා වැදගත්ය. හතරැස් කොටුවක ආකාරයට ස්ථානගත වී සිටින වාස්තු පුරුෂයා සෑම නිවසකම සහ සෑම ඉඩමකම ස්ථානගතව සිටින බව වාස්තු විද්‍යාවේ පැහැදිලිව සඳහන් වේ.**

## ඉඩමට අරක්ගත්

# වාස්තු පුරුෂයාගේ නොපෙනෙන බලමහිමය

ඊසාන දිශාවටත්, නිරිත දිශාවටත් හැරී පිහිටන වාස්තු පුරුෂයාගේ හිස ඊසාන දිශාවට පිහිටයි. එය ඕනෑම ඉඩමකට, නිවසකට පොදු කාරණාවකි. මෙම වාස්තු පුරුෂයා සංකල්පයට අනුව නිවසක හෝ ඉඩමක බලයන් සහ ශක්තීන් ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න ඉතා පැහැදිලිව හඳුනාගත හැකිය.

වාස්තු විද්‍යා සංකල්පයට අනුව බලද්දී මෙම වාස්තු පුරුෂයාගේ විවිධ කොටස් පිහිටන දිශාවන් ඇත. ඒ අනුව ඉඩමේ, නිවසේ ඒ ඒ දිශාවන්ගේ වාස්තු පුරුෂයාගේ ශරීරයේ විවිධ කොටස් ස්ථානගත වන අතර, එම කොටස් වාස්තු සිද්ධාන්තවලට නොගැළපෙන කාරණාවලින් පීඩාවට පත්වුවහොත් එම නිවසේ හෝ ඉඩමේ පදිංචිකරුවන්ට ඒ ඒ ශරීරාංගවල පීඩාවන් විඳීමට සිදුවනු ඇත.

මෙම වාස්තු පුරුෂයාගේ නොපෙනෙන බලය තුළ විශ්ව ශක්තියේ විවිධ ප්‍රභවයන් ගැබ්ව ඇති අතර, ඒ ඒ දිශාවන්ගේ එම ශක්ති ප්‍රභවයන් ගැබ්වන අයුරුදු වාස්තු පුරුෂය සංකල්පය අනුව පෙන්වාදී ඇත. මෙම ශක්ති ප්‍රභවයන් අතර මිනිසාට යහපත් සහ අයහපත් ප්‍රභවයන් ඇති අතර, ඒවා ඉඩම හෝ භූමිය තුළට ගැබ්වීම සිදුවේ. එහිදී අසුබ බලයන්ගේ ශක්තිය ප්‍රබල වුවහොත් නිවැසියාට අයහපතක්ද, යහපත් ශක්ති ප්‍රභවයන් වර්ධනය වුවහොත් නිවැසියන්ට සුබ ප්‍රතිඵලද ලැබෙන බව හඳුනාගෙන ඇත.

**කෝප වුණොත් ලෙඩ රෝග ගෙට**

අතීත වාස්තු සිද්ධාන්ත අනුව වාස්තු පුරුෂයා මුණින් අතට පොළොවේ දිගාවී සිටින බවටද මතයක් වෙයි. එහිදී ඒ ඒ දිශාවන්ගේ කළ යුතු නොකළ යුතු කාර්යයන් පිළිබඳ හෙළ වාස්තු රහස් ඇසුරේ පෙන්වාදී තිබේ. ඒ අනුව එකී දිශාවල නොගැළපෙන ඉදිකිරීම් හෝ නොකළ යුතු ක්‍රියාවන් කළහොත් වාස්තු පුරුෂයාගේ එකී අංශය පීඩාවට පත්වන්නේ යම්සේද එලෙසින්ම නිවැසියන්ගේ එම ශරීරාංග හෝ ඒ හා සම්බන්ධ ඉන්ද්‍රිය පීඩාවට පත්වන බවට හඳුනාගෙන ඇත.

ඒ අනුව වාස්තු පුරුෂයාගේ හිස ඊසාන දෙසටත්, පාද නිරිත දෙසටත්, වැලමිට ගිනිකොනට හා වයඹටත් පිහිටා ඇත.

එසේම වාස්තු පුරුෂයාගේ හදවත, පපු ප්‍රදේශය, ලිංග ප්‍රදේශය කිසිදු ආකාරයකින් පීඩා නොවිය යුතු බවටත් වාස්තු විද්‍යා සිද්ධාන්තවල පැවසෙයි. වාස්තු පුරුෂයාගේ මෙම ස්ථාන ආශ්‍රිතව බර අධික දේ ස්ථානගත කිරීම, විශාල කුලුනු වැනි දේ ගොඩනැගීම, පොකුණු ආදිය ඉදිකිරීම නුසුදුසු වෙයි. එසේම නිවසක ගින්දර සම්බන්ධ කටයුතු කෙරෙන මුළුතැන්ගෙය අනිවාර්යයෙන්ම ගිනිකොන දිශාවටම ගත යුතුය. මොනම හේතුවකටවත් මෙය ඊසාන පැත්තට නොගත යුතුය. ඊසාන දිශාවට මුළුතැන්ගෙය ගැනීමෙන් නිවැසියන් නිතර අසනීපවලට ගොදුරු වන බව වාස්තු විද්‍යාවේ සඳහන් වෙයි.

යම් ලෙසකට නිවසක් ඉදිකිරීමේදී වාස්තු පුරුෂයාගේ වැලමිටි පීඩාවී නම් නිවැසියන්ට වැලමිටි අපහසුතාද, වාස්තු පුරුෂයාගේ පාද දණහිස් ආදිය පීඩා වී නම් නිවැසියන්ටද එවැනිම පීඩාද ඇතිවන බව දත යුතුය.

වාස්තු පුරුෂයා මුනින් අතට සිටින ඉරියව්ව කිසිවිටෙක වෙනස් නොවේ. එය ස්ථිර පිහිටීමකි. ඊට අමතරව වාස්තු පුරුෂයාට තවත් මුහුණුවර දෙකක් වෙයි. එකක් නිත්‍ය වාස්තු පුරුෂයා වන අතර, එම වාස්තු පුරුෂයා සෑම හෝරා දෙකකටම වරක් සිය ඉරියව්ව වෙනස් කරයි. අනෙක් වාස්තු පුරුෂයා සෑම දිනකම ගමන් කරයි. මෙම ගමන පෘථිවියේ ඍතු වෙනස් වීමට සාපේක්ෂව සිදුවේ.

සූර්යයා උතුරු අර්ධ ගෝලයේ සිට දකුණු අර්ධ ගෝලයට සංක්‍රමණය වීම අනුව ගොඩනැගිල්ලකට ලැබෙන ආලෝකය හා උෂ්ණත්වය වෙනස් වේ. මේ නිසාම එක් එක් ඍතුවට අනුව විශ්ව ශක්තීන් එම ගොඩනැගිල්ලට ඇතුළු වන බව වාස්තු විද්‍යා රහස් ඇසුරින් හෙළිවෙයි.

මාර්තු මාසයේ සිට මැයි දක්වා සූර්ය බලය උතුරු දෙසින්ද, ජූනි සිට අගෝස්තු දක්වා නැගෙනහිරින්ද, සැප්තැම්බර් සිට නොවැම්බර් තෙක් දකුණු දෙසින්ද, දෙසැම්බර් සිට පෙබරවාරි තෙක් බටහිර දෙසින්ද සූර්ය බලය පොළොවට ලැබේ. මෙහි ප්‍රාදේශීය වශයෙන් සුළු වෙනස්කම් සිදුවුවද පොදුවේ ගතහැකි සංසිද්ධියක් සේ වාස්තු විද්‍යාවේ සඳහන් වෙයි. මෙම කාලවලට ඒ ඒ දිශාවට දොර ජනෙල් විවර කර තැබීම යහපත් බවද පැහැදිලි කර ඇත. මෙමගින් ඒ ඒ කාලවල එම ගොඩනැගිලිවල යහපත් ශක්තීන් ක්‍රියාකාරී වීමට අවශ්‍ය වටපිටාව නිර්මාණය වනු ඇත.

කෙසේ නමුත් ගෘහයක වාසය කරන යම් පිරිසකට, කෙනෙකුට නිතර අස්ථි, උදර හෝ වෙන යම් අපහසුතා, ආබාධ සෑදේ නම් හෝ ධනය, බලය, ශක්තිය මෙන්ම පුද්ගල ආකර්ෂණය ගිලිහේ නම් එකී අය සිටින නිවස හෝ ඉඩම තුළ වාස්තු පුරුෂයා පීඩාවට පත්ව ඇති බවට ඉඟි පළකෙරේ.

**ජ්‍යොතිෂ සහ වාස්තුවේදී**
**ජ්‍යොතිෂ පර්යේෂක**
**ජ්‍යොතිෂ පුවත්පත් රැසක**
**හිටපු ප්‍රධාන කර්තෘ**
**ජේ.එන්.කේ. රත්නායක**
**0777579404**

# ලග්න රැසකට සුපිරි දින හතක්

## 2026 ජූලි 05 සිට 11 වැනිදා දක්වා සඳු රාශි තුනකට බුධ රාශි දෙකකට ගෝචර වෙද්දී ග්‍රහ මණ්ඩලය තුළ ප්‍රබල යෝග පොකුරක්.



**වර්ෂ 2026ක් වූ ජූලි මස 05 වැනිදායින් ඇරැඹී 11 වැනිදායින් අවසන් වීමට නියමිත ඉදිරි සතිය ග්‍රහ ගෝචරයන් විමසීමේදී සතිය ආරම්භ වන්නේ රවි මිථුන රාශියේත්, සඳු, රාහු කුම්භ රාශියේත්, කුජ, යුරේනස් වෘෂභ රාශියේත්, බුධ, ගුරු කටක රාශියේත්, සිකුරු සිංහයේත්, නැප්චූන්, ශනි මීනයේත් ගෝචර වෙමිනි. එමෙන්ම සතිය තුළ සඳු රාශි තුනකත්, බුධ රාශි දෙකකත් ගෝචර වීමට නියමිතය. මේ අනුව ලෝකයේත්, රට තුළත් සමස්ත රට වැසියන්ගේත් ජීවිත තුළ සුවිශේෂ වෙනස්කම් රාශියක් සිදුවීමට නියමිතව ඇත. එකී ග්‍රහ ගෝචරයන්ට අනුව ඉදිරි සතිය තුළ ලෝකයේ ප්‍රධාන පෙළේ රාජ්‍ය නායකයෙක් සම්බන්ධ අලුත් මාතෘකාවක් කතාබහට ගැනෙනු ඇත. ඒ අනුව ලෝකයේ ප්‍රබල රටවල් කිහිපයක් සම්බන්ධ මතභේදාත්මක ඉඟි පහළ වනු ඇත.**

ගමන් බිමන් සම්බන්ධව සහ ආහාර සම්බන්ධව කතාබහ කෙරෙන අතර, ලොව තුළත් රට තුළත් ආගමික අංශය සම්බන්ධ අය ගැන විවිධ සිදුවීම්වලට ඉඩ ඇත. මෙතෙක් එකඟතාවක් නොතිබූ කරුණු පිළිබඳ එකඟතා ඇතිවේ. එමෙන්ම අධ්‍යාපනය සම්බන්ධ කාරණා ගැන කතාබස් හා තීන්දු තීරණද ඇතිවීමට ඉඩ ඇත. ප්‍රසිද්ධ පුද්ගලයන් අපහසුතාවට පත්වීමේ ඉඩකඩ ඇති කාලයකි.

කෙසේ නමුත් ඉදිරි සතියේ ග්‍රහ තත්ත්වය අනුව සමස්ත රටවැසියන්ට කෙසේදැයි විමසා බැලීමේදී ඒ ඒ ලග්නවලට පහත පරිදි සුබ - අසුබ බෙදීයනු ඇත.

### මේෂ

#### වාසනාව අත ළඟටම

ඉතා වාසනාවන්ත සතියකි. මෙතෙක් කලක් දියුණුවට තිබූ බාධා මගහැරී ගොස් නව ආදායම් මාර්ග පාදාගන්නට වාසනාව පෑදේ. එමෙන්ම දුරබැහැර සිටින අයකුගෙන් මූල්‍ය ලාභ ලැබෙනු ඇත. අලුත් හිතමිත්‍රයන් හඳුනාගැනීමට ලැබෙන අතර, ස්ත්‍රී පාර්ශ්වයට විශේෂ වාසි අත්වේ. කාලයකට පසු හිතවතකු හෝ ඥාතියකු හමුවීමෙන් සතුටට කරුණු යෙදේ. රහසිගත සබඳතාවකට හේතු යෙදෙනු ඇත.

### වෘෂභ

#### සති අගදී මුදල්

අත ඇති මුදල් ප්‍රවේසම් කරගත යුතු සතියකි. නැතහොත් අනවශ්‍ය ආකාරයට වියදම් වීමට ඉඩ තිබේ. ගනුදෙනුවලදී ප්‍රවේසම් විය යුතුය. එමෙන්ම හදිසි අනතුරු කැපුම් කෙටුම් සිදුවිය හැකි කටයුතු මෙම සතියේ සිදුකිරීම සුදුසු නැත. සතිය අගදී තත්ත්වය වෙනස් වේ. නව ආදායම් මාර්ග පෑදෙනු ඇත. තමාට ලැබෙන්නට තිබූ මුදලක් ලැබීමට ඉඩ ඇති නිසා අවධානයෙන් පසුවන්න.

### මිථුන

#### කතාබහ පරිස්සමෙන්

ඇඳුම් සම්බන්ධ කතාබස් දුරදිග යෑමෙන් තමාට සමීප අයකු අමනාප වීමට ඉඩ ඇති හෙයින් ප්‍රවේසම් වන්න. එමෙන්ම පිටස්තර තැනක වාසයට අවස්ථා යෙදෙනු ඇත. දුර ගමන් යෙදෙන සතියකි. අන්‍යාගමිකයන් හෝ පූජ්‍ය පක්ෂය සමග විවිධ ගනුදෙනු යෙදේ. මෙතෙක් කලක් තමා ප්‍රයෝජනයට නොගත් දෙයක් සම්බන්ධයෙන් නව සැලසුමක් ක්‍රියාවට නැංවෙනු ඇත. සතිය අගදී විශේෂ වාසියක් ගැන ආරංචියක් ලැබේ.

### කටක

#### සතිය මැද සුබ ආරංචි

මේ සතියේ ඔබ ප්‍රවේසම් විය යුතුය. අනවශ්‍ය ආකාරයේ ගමන් බිමන් සුදුසු නැත. එමෙන්ම උදරය ආශ්‍රිත සුලු සුලු අසනීප යෙදෙන්නට ඉඩ තිබේ. අන් අයගේ වැඩකටයුතු ගැන නොසතුටට හේතු යෙදේ. කෙසේ නමුත් සතියේ මැද සිට තම පවුලට සම්බන්ධ කෙනකු ගැන සුබ ආරංචියක් ලැබීමට නියමිතය.

### සිංහ

#### හදිසි ධන ලාභ

සිතේ සතුටට හේතු යෙදේ. සැප පහසු ගමන් බිමන් මෙන්ම රසවත් ආහාර පාන ලැබෙන සතියකි. ස්ත්‍රී - පුරුෂ ආකර්ෂණය ඉහළින්ම ලැබෙන සතියකි. මෙතෙක් කලක් හිතේ තිබූ සබඳතාවක් ස්ථිර වන කාලයකි. එමෙන්ම නොසිතූ ධන ලාභ සහ ආර්ථිකයේ විශේෂ වාසි අත්වනු ඇත. අන්සතු වස්තුවක් හෝ පවුලේ අයකුට අයත් ධනයක් හිමිවන බවට ඉඟි ලැබෙන කාලයකි.

### කන්‍යා

#### නව ආරාධනා

සතුරන් පරදා ජය ලැබිය හැකි කාලයකි. කිසිදු ආකාරයකින් පරාජයට පත් නොවී අරමුණුවලට යෑමට හැකි අතර, මෙතෙක් කලක් මගහැරෙමින් තිබූ කටයුතු කිහිපයක් සඵල කරගැනීමට හොඳ සතියකි. නව ආයෝජන සහ සැලසුම් ක්‍රියාවට නැංවීමට ඉතා යහපත්ය. ගමන් බිමන් සඳහාත් උත්සව සඳහාත් ආරාධනා ලැබේ.

### තුලා

#### සිතේ සතුට ඉහළට

ඔබගේ සියලු බලාපොරොත්තු ඉටුකර ගැනීමට උනන්දුව සහ උත්සාහය වර්ධනය කෙරෙන සතියක් බැවින් ඒ සඳහා උනන්දු වන්න. හිතවතුන්ගෙන් ඥාතීන්ගෙන් උදව් උපකාර ලැබේ. පෙම් සබඳතා කෙරෙහි සිත යොමුවනු ඇත. හදිසියේ හමුවන මිතුරෙකු හෝ මිතුරියක නිසා සිතේ පිබිදීමක් සිදුවනු ඇත. නව හැඟීම් සහ දැනීම් ඇතිවන කාලයකි.

### වෘශ්චික

#### නව සබඳතා

ගමන් බිමන්වලින් නව සබඳතා ගොඩනැගෙනු ඇත. ඇතැම් විට විවිධ මිත්‍රයන් හමුවන අතර ඔවුන් සමග නව ගිවිසුම්වලට යොමුවීමටද ඉඩ තිබේ. අලුත් වැඩසටහන් සහ සැලසුම් සමග ගෙවෙන සතියකි. විශේෂ මූල්‍ය ලාභද යෙදේ. සතිය අගදී මතගැටුමකට ඉඩ ඇති හෙයින් ප්‍රවේසම් විය යුතුය.

### ධනු

#### වැඩිහිටි මිතුරෙකුගෙන් උදව්

පවුලට සම්බන්ධ අයකු ගැන විශේෂ ආරංචියක් ලැබේ. මහන්සියේ තරමට ප්‍රතිඵල ලැබෙන අතර දුරබැහැර ගමන් බිමන් සමග නව ආදායම් මාර්ගද පෑදේ. අනාගතය ගැන සිතා කරන සැලසුමකට අවස්ථාව යෙදේ. අලුත් ඇඳුම් පැළඳුම් තෑගි ලෙස ලැබෙනු ඇත. තමාට වඩා වයසින් වැඩි මිතුරෙකු හෝ මිතුරියක හමුවන සතියකි. එමගින් විශේෂ වාසිද ඇත.

### මකර

#### මත ගැටුම්

ඔබගේ රැකියාව සම්බන්ධයෙන් තිබූ ගැටලු බාධා මගහැරී යෑමට හේතු යෙදේ. උනන්දුවේ තරමට ප්‍රතිඵල ලැබෙන නිසා උනන්දුවෙන් කටයුතු කළ යුතුය. මත ගැටුම් මතවාද සුදුසු නැත. නිතර කේන්ති යන ස්වභාවයක් පෙන්වයි. සහෝදර පක්ෂය ගැන අමනාප යෙදේ. තමාට සමීප පවුලේ අයකු මේ සතියේ ඔබ සොයා පැමිණේ.

### කුම්භ

#### සති අග ධන ලාභ

ඔබගේ සිත තුළ නොසන්සුන්කාරී හැඟීම් වැඩිකෙරෙන හෙයින් ප්‍රවේසමෙන් ගනුදෙනු කළ යුතුය. අනාගතය ගැන සිතා කරන කටයුතු සතිය මැදදී වෙනස් වෙයි. දුර ගමන් සඳහා ආරාධනා ලැබුණද ප්‍රවේසම වැදගත්ය. එමෙන්ම විශේෂ හේතුවක් නැතිව අන් අය සමග ගැටෙන්නට නොයා යුතුය. හදිසි ධන ලාභ සති අන්තයේ යෙදෙනු ඇත.

### මීන

#### නොසිතූ මූල්‍ය ලාභ

විශේෂ ආරාධනාවකින් සිතේ සතුටට හේතු සහ ගමන් බිමන්වලින් ආර්ථිකයට විශේෂ වාසි අත්වන අතර, ව්‍යාපාර කටයුතු සහ බුද්ධිය මෙහෙයවා කරන වැඩවලටත්, නිර්මාණ කටයුතු කරන්නන්ටත් හොඳම සතියකි. නොසිතූ මූල්‍ය ලාභයකුත් පෙන්නුම් කෙරේ. සතිය අගදී විශේෂ වැඩ කිහිපයකින් ධනය ලැබීමට අවස්ථාව ඇත. බලාපොරොත්තු ඉටුකර ගන්නට යහපත් සතියකි.

**ජ්‍යොතිෂ සහ වාස්තුවේදී**
**ජ්‍යොතිෂ පර්යේෂක**
**ජ්‍යොතිෂ පුවත්පත් රැසක හිටපු ප්‍රධාන කර්තෘ**
**ජේ.එන්.කේ. රත්නායක**
**0777579404**